# සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

## දන්ත කාර්මික / වෘත්තීය චිකිත්සක / අන්වීක්ෂක II පන්තිය "අ" බණ්ඩ
## කාර්යක්ෂමතා කඩඉම් විභාගය -2000

## ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි

කාලය පැය 01යි විනාඩි 30යි. මුළු ලකුණු 100යි.

එක කොටසකින් යටත් පිරිසෙයින් ප්‍රශ්න 02 බැගින් තෝරාගෙන ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.

## I කොටස

01. කෙටි සටහන් ලියන්න.

(අ) රජයේ සේවයෙන් විශ්‍රාම ගිය අයකු නැවත සේවයට බඳවා ගැනීම.
(ආ) ඉල්ලා ගත් මෝටර් රථ පාවිච්චි කිරීම
(ඇ) රජයේ නිලධාරියකු කාර්යාලය තුළ මත්පැන් හා විෂ මත්ද්‍රව්‍ය භාවිතය
(ඈ) ජනමාධ්‍යවලට හෝ මහජනයාට හෝ නිල ප්‍රවෘත්ති සැපයීම

02. "ස්ථිර රජයේ නිලධාරීවරයෙකුට මෙරට නියමිත අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම සඳහා වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාගැනීමට හිමිකම් ඇත" සාකච්ඡා කරන්න.

03. රාජ්‍ය ආයතනයක් විසින් දුම්රිය බලපත්‍රයක් නිකුත් කළ හැක්කේ කවර කටයුතු සඳහාද? පැහැදිලි කරන්න.

04. "රජයේ නිලධාරීවරයෙකුට තම නිත්‍ය රැකියාවට හෝ ධුරයට පරිබාහිරව සේවාවන් ඉටුකළ නොහැකිය" විමසන්න.

## II කොටස

05. බැංකුවකින් චෙක්පතක් අගරු කරනු ලැබුවහොත් ගතයුතුව ඇති ක්‍රියාමාර්ග මොනවාද?

06. "විරාමෝං ක්‍රියා පරිපාටිය" පැහැදිලි කරන්න.

07. රාජ්‍ය ආයතනයක අභ්‍යන්තර විගණන අංශයකින් බලාපොරොත්තුවන කාර්යභාරය කුමක්ද?

---

08. කෙටි සටහන් ලියන්න.

(අ) ඇස්තමේන්තු පිළියෙල කිරීම
(ආ) ඒකාබද්ධ අරමුදලට බැරකරන ලද ආදායම් ආපසු ගැනීම
(ඇ) වවුචර් සහතික කිරීම
(ඈ) ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා